# උත්ථාන සමයේ සයවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය ක්‍රියා 8: 5–8, 14–17

*අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.*

අපෝස්තුළුවරු ඔවුන් මත අත් තැබූ කළ
ශුද්ධාත්මයාණෝ පහළ වූහ.

පිලිප් සමාරියේ නුවරකට ගොස් එහි ක්‍රිස්තුන් වහන්සේ ගැන දේශනා කළේ ය. පිලිප් කී දේ ඇසූ, ඔහු කළ අරුමපුදුම දේ දුටු, ජන සමූහයෝ ඔහුට එක සිතින් සවන් දුන්හ. අශුද්ධාත්මයන් වැහී සිටි බොහෝ දෙනෙකුගෙන් ඒ ආත්මයෝ මහ හඬින් මොර ගසමින් දුරු වී ගියහ. බොහෝ අංශභාග රෝගීහු ද කොරු ද සුව කරනු ලැබූ හ. ඒ නුවර මහත් ප්‍රීතියක් ඇති විය. සමාරියයන් දෙවියන් වහන්සේගේ වචනය පිළිගත් බව ජෙරුසලමේ සිටි ප්‍රේරිතයන්ට සැළවූයෙන් ඔහුවු පේදුරු සහ ජොහන් ඔවුන් වෙතට යැවූහ.

ඔව්හු එහි ගොස් ඔවුන්ට ශුද්ධාත්මයාණන් ලැබෙන ලෙස යාච්ඤා කළහ. මන්ද, ඔවුන් ජේසුස් වහන්සේගේ නාමයට බව්තීස්ම–ස්නාපනය කරනු ලැබුවා මිස, ඒ වනතුරුත් ශුද්ධාත්මයාණන් ඔවුන්ගෙන් කිසිවකු කෙරෙහි පැමිණ තිබුණේ නැත. ප්‍රේරිතවරුන් ඔවුන් පිට අත් තැබූ කළ, ඔවුන්ට ශුද්ධාත්මයාණන් ලැබිණි.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 66: 1–7, 16, 20

පිළිතුර: ලෝ වැසි සියල්ලෙනි, දෙවිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න.

ගීය : ලෝ වැසි සියල්ලෙනි, දෙවිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න.
එතුමන්ගේ කීර්තිමත් නාමයට ගී ගයන්න.
දෙවිතුමන්ට මෙලෙස කියන්න:
“ඔබේ ක්‍රියා කොපමණ බිය ජනක ද?
ඔබේ බලපරාක්‍රමය අති මහත් ය.
එබැවින් ඔබේ සතුරෝ ඔබ අබිමුව බියෙන් මිරිකෙන්නෝය.

ලෝ වැසි සියල්ලෝ ඔබ නමදින්නෝ ය:
ඔබට ගී ගයා ඔබේ නම පසසන්නෝ ය.
එන්න, දෙවිඳුන්ගේ පුදුම ක්‍රියා නරඹන්න.
එතුමන්ගේ ක්‍රියා මිනිසුන් අතර බිය ජනක ය.
එතුමාණෝ මුහුද වියළි බිමක් කළ සේක.
සෙනඟ එය මැදින් පයින් ගමන් කළෝය.

එබැවින් එතුමන් තුළ අපි ප්‍රීති ප්‍රමෝද වන්නෙමු.
එතුමාණෝ බලපරාක්‍රමයෙන් සදහට ම
ලොව පාලනය කරන සේක:
එතුමාණෝ විජාතීන් දෙස නෙත් යොමා බලන සේක.
කිසි ම කැරළිකරුවෙක් එතුමන්ට එරෙහි ව නොනැඟිටීවා!

දෙවිඳුන් නමදින සියල්ලෙනි! එන්න, සවන් දෙන්න,
එවිට එතුමාණන් මට කළ දේ මම කියා දෙන්නෙමි.
දෙවිඳුන්ට ප්‍රශංසා වේ වා! මාගේ අයැදුම
එතුමාණෝ ඉවත නොදැමූ සේක:
සිය පෙමින් මා ඇත් නොකළ සේක."

## දෙවන දේව ප්‍රකාශනය 1පේදුරු 3:15-18

*ශුද්ධ වූ පේදුරු තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

ජේසුස් වහන්සේ මිනිස් ස්වභාවයෙන් මරණයට පත්කරනු ලැබ,
දිව්‍ය ස්වභාවයෙන් උත්ථාන කරනු ලැබූ සේක.

ඔබගේ සිතින් ක්‍රිස්තුන් වහන්සේට සමිඳාණන් වහන්සේ හැටියට ගෞරව කරන්න. ඔබට ඇති බලාපොරොත්තුව ගැන ඔබෙන් ප්‍රශ්න කරන සියල්ලන්ට පිළිතුරු දීමට නිතර සූදානම් ව සිටින්න. එහෙත් ආචාරශීලී ව ද ගෞරවයෙන් යුක්ත ව ද එසේ කළ යුතු ය. ඔබ නිදොස් හෘදය සාක්ෂියක් ඇති ව සිටින්න. එවිට ඔබට අපහාස කරමින් ඔබට විරුද්ධ ව කතාකරන අය, ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමියන් වශයෙන් ඔබේ

යහපත් හැසිරීම දැක ලජ්ජාවට පැමිණෙනු ඇත. ඔබ යහපත කර දුක් විඳීම දේව කැමැත්ත වේ නම්, එය නපුර කර දුක් විඳීමට වඩා හොඳ ය.

ක්‍රිස්තුන් වහන්සේ ඔබේ පව් උදෙසා වරක් දිවි පිදූ සේක. උන් වහන්සේ ධර්මිෂ්ඨ ව සිටි නමුත් දෙවියන් වහන්සේ වෙතට ඔබ පමුණුවන පිණිස අධර්මිෂ්ඨයන් වෙනුවෙන් දිවි පිදූ සේක. උන් වහන්සේ මනුෂ්‍ය ස්වභාවයෙන් මරණයට පත්කරනු ලැබූ සේක; ආත්මික ස්වභාවයෙන් උත්ථාන කරනු ලැබූ සේක.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද — ජොහන් 14: 23

ආලේලූයා! ආලේලූයා!
යමෙක් මට ප්‍රේම කරන්නේ නම්,
හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය.
මාගේ පියාණන් වහන්සේද ඔහුට ප්‍රේමකරන සේක.
අපි ඔහු වෙතට පැමිණ ඔහු සමඟ වාසය කරන්නෙමු.
ආලේලූයා!

## සුවිශේෂය — ජොහන් 14: 15–21

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

**මම පියාණන් වහන්සේට යදින්නෙමි.**
**ඔබ වෙත සහායදායකයකු එවන්නෙමි.**

"ඔබ මට ප්‍රේම කරන්නාහු නම්, ඔබ මාගේ ආඥා පිළිපදින්නහු ය. එවිට මම පියාණන් වහන්සේගෙන් අයදින්නෙමි; උන් වහන්සේද ඔබ සමඟ සදහට ම සිටින පිණිස වෙනත් සහායදායකයෙකු දෙන සේක. ඒ සහායදායකයාණෝ, සත්‍යයේ ආත්මයාණෝ ය. උන් වහන්සේ පිළිගැනීමට ලෝකයා අපොහොසත් ය. මන්ද, ලෝකයා උන් වහන්සේ දකින්නේ වත් හඳුනන්නේ වත් නැත. එහෙත් ඔබ උන් වහන්සේ හඳුනන්නහු ය. මන්ද, උන් වහන්සේ ඔබ සමඟ නැවතී සිටිමින් ඔබ

තුළ වැඩවසන සේක. ඔබ අනාථවීමට ඉඩ නොදෙන්නෙමි, මම නැවත ඔබ වෙතට එන්නෙමි.

තව ස්වල්ප වේලාවකින් ලෝකයා මා තවත් නොදකිති. එහෙත් ඔබ මා දකින්නහු ය: කුමක් හෙයින් ද, මා ජීවත් වන නිසා ඔබත් ජීවත් වන බැවිනි. ඒ දවසේ දී, මා පියාණන් වහන්සේ තුළ ද ඔබ මා තුළ ද මා ඔබ තුළ ද සිටින බව ඔබ දැනගන්නහු ය. මාගේ ආඥා පිළිගෙන ඒවා පිළිපදින යම් තැනැත්තෙක් වේද, මට ප්‍රේම කරන්නේ ඔහු ය. යම් තැනැත්තෙක් මට ප්‍රේම කරන්නේ ද මාගේ පියාණන් වහන්සේත් ඔහුට ප්‍රේම කරන සේක. මම ද ඔහුට ප්‍රේම කොට ඔහුට එළිදරව් වන්නෙමි"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*



## “ඔබ සමග සදහට ම සිටින පිණිස සහායදායකයෙකු දෙන සේක.”

*උත්ථාන සමයේ සයවන ඉරුදින - 21-05-2017*

## හැඳින්වීම

ඔබට ශරීරයක් සහ මනසක් මෙන් ම ආත්මයක් ඇති බව පිළිගන්නවාද? කොහේද ඔබගේ ආත්මය? ඔබට ආත්මයක් තිබෙන බව දැනෙනවාද? ශරීරයට නොදැනෙන, මනසට නොවැටහෙන දේ ඔබට සිදුවී තිබේද? ඒ ඔබේ ආත්මය යැයි සිතන්නට බැරිද? ආත්මය අවදි වී නැත්නම් අපි හුදෙක් භෞතික ජීවීන් ලෙස පමණක් ලෙස දිවි ගෙවමු. ප්‍රසාද ස්නාපනයේ බලයෙන් අපේ ආත්මය ක්‍රිස්තුන් වහන්සේගේ ශුද්ධාත්මය සමග බද්ධ වී ඇත. ඔබ තුළ වැඩ සිටින එම ශුද්ධාත්මයාණන්ට ක්‍රියාකාරී වීමට ඔබ ඉඩ දී තිබේද? උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය වර්ධනය වීමට ඔබ කර ඇත්තේ කුමක්ද?

## දේව වචනය

අප කෙමෙන් කෙමෙන් ස්වර්ගාරෝහණ මංගල්‍යයට සහ ශුද්ධාත්ම ආගමනයට සමීප වෙමින් සිටිමු. අද දවසේ දීත් ශුද්ධවූ සුවිශේෂයෙන් අපට හමුවන්නේ ක්‍රිස්තුන් වහන්සේ ගෝලයින්ගෙන් සමුගැනීමට සූදානම් වන ආකාරයයි. එහිදී උන්වහන්සේ විශේෂ පොරොන්දුවක් දෙන සේක. එනම් ඔවුන් සමග වැඩ සිටීමට සහායදායකයෙකු එවීමටයි. සහායදායකයා නම් ශුද්ධාත්මයාණන් වහන්සේයි. ලෝකයා තව දුරටත් ක්‍රිස්තුන් වහන්සේව නොදකින සේක. එහෙත් උන්වහන්සේගේ ගෝලයින් උන්වහන්සේව දකිති (අද ද එසේමය). එමෙන්ම උන්වහන්සේ ජීවත්වන බැවින් ඔවුහු ද ජීවත් වෙති. තවදුරටත්, ඔවුහු පියාණන් වහන්සේ සහ පුත්‍රයාණන් වහන්සේගේ එක්ව වැඩ සිටීම අත්දකිති.

**ක්‍රියා 8:5-8, 14-17**

**ගීතාවලිය 66:1-7, 16, 20**

**1 පේදුරු 3:15-18**

**ජුවාම් 14:15-21**

පෙරුසලමෙන් දේශනා කිරීම ඇරඹූ අපෝස්තුළුවරු ක්‍රම ක්‍රමයෙන් පිට පළාත් වලටත් ගියහ. පිලිප්ගේ දේශනා ඇසූ සමාරියේ ජනතාව ක්‍රිස්තුන් වහන්සේව පිළිගෙන බෞතීස්ම ස්නාපනය ලැබූහ. ඉන් අනතුරුව පේදුරු සහ ජොහාන් පෙරුසලමේ සිට සමාරියට ගොස් ඔවුන් මත අත් තබා යාච්ඤා කළ විට ඔවුන්ට ශුද්ධාත්මයාණන් ලැබුණි. වතුරෙන් බෞතීස්ම කිරීම සහ ශුද්ධාත්මයාණන් ගෙන් ආලේප කිරීම යනු දෙකක් යැයි පටලවාගෙන සිටින මූලධර්මවාදීන් (උදා: Assembly of God) ඊට සාධක ලෙස ඉදිරිපත් කරන්නේ මේ පාඨයයි. එහෙත් ලූක් තුමා ක්‍රියා පොතේ සඳහන් කරන අනෙක් සිද්ධි දෙස බැලූ විට මේ අදහස වැරදි බව පැහැදිලිව පෙනේ. විශේෂයෙන් කොර්නේලියස් පිළිබඳ සිද්ධියේ දී ඔවුන්ට



ශුද්ධාත්මයාණන් ලැබෙන්නේ බෞතීස්ම ස්නාපනය ලැබීමට පෙරය (ක්‍රියා 10). නමුත් ක්‍රියා පොතේ වෙනත් කොටස් අපට පෙන්වා දෙන්නේ ප්‍රසාද ස්නාපනයත්, ශුද්ධාත්ම දීමනාවත් එකවර ලැබෙන බවයි. පෙන්තකොස්ත දිනයේ පේදුරු තුමාගේ දේශනාවේ එය අඩංගු වේ (ක්‍රියා 2:38). ලූක් තුමා කොර්නේලියස් සහා සමාරිය වැසියන් පිළිබඳ සිද්ධීන් වෙනස්

පිළිවෙලකට සඳහන් කරන්නේ වෙනත් අරමුණු මුල් කරගෙනය. සමාරියයන්ට සුබාරංචිය දේශනා කිරීම ජුදයාවෙන් පිට එසේ කළ පළමු අවස්ථාව විය. ලූක් තුමා පෙන්වා දෙන්නේ කෙතරම් ඈතට පැතිර ගියත් සභාව අපෝස්තුලුවරුන්ගේ අනුමැතිය යටතේ පැවතිය යුතු බවයි. කොර්නේලියස්ගේ සිද්ධියෙන් පෙන්වා දෙන්නේ විජාතිකයින් වෙතට සුබාරංචිය ගෙන යෑම මිනිසුන්ගේ නොව දෙවියන් වහන්සේගේ තීරණයක් බවයි.

අලුතින් කිතු දහම වැළඳගත් අය තමන්ගේ විශ්වාසය ගැන ප්‍රීතියෙන් පසුවූහ. කෙසේවුවත් පසුගිය සතියේ දී මෙන් අදත් පේදුරු තුමා ඔවුන්ට මතක් කර දෙන්නේ විශ්වාසයේ ගමන සුවදායි එකක් නොවන බවයි. විශ්වාසය ආරක්ෂා කර ගැනීමට ද ඒ ගැන ප්‍රශ්න කරන අයට ඉවසීමෙන් සහ සන්සුන්ව පිළිතුරු දීමට ද ඔවුන් සූදානම් ව සිටිය යුතුය.

## මෙනෙහි කිරීම

කිතුනු පිබිදීමේ ව්‍යාපාර (charismatic renewal movements) වලට සම්බන්ධ අය "ශුද්ධාත්මයාණන්ගේ බෞතීස්ම ස්නාපනය (Baptism of the Holy Spirit)" ගැන නිතර සඳහන් කරනු අසන්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ද කිතුදන පුබුදුව, උත්ථාන වූ සමිඳුන්ගේ සංසය වැනි කණ්ඩායම් මේ වචනය බහුලව භාවිතා කරයි. මොකක්ද මේ ශුද්ධාත්ම බෞතීස්මය? එය අප ළදරු වියේ දී ලබා ඇති ප්‍රසාද ස්නාපනයට වඩා වෙනස් ද? ප්‍රසාද ස්නාපනයේ දී අපට ශුද්ධාත්මයාණන් ලැබෙන්නේ නැද්ද? බොහෝ කතෝලිකයින්ට මේ ප්‍රශ්නය පැන නැගී ඇතුවාට සැක නැත.



ප්‍රසාද ස්නාපන සක්‍රමේන්තුව ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළට ඇතුළු වන මුල් ම සහ ප්‍රධාන ම අවස්ථාවයි. මෙම අද්විතීය සක්‍රමේන්තුව "*පුනරුත්පාදනය නැමති ධෝවනය ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ අලුත් කිරීම ද*" ලෙස සභා මාතාව හඳුනා ගන්නීය (ක. ස. ධ. #1215, තීතස් 3:5). ප්‍රසාද ස්නාපනයේ දී අප තුළට වැඩම කරන ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය අප තුළ දිනෙන් දින වර්ධනය වේ. ඒ අප උන්වහන්සේට ඉඩ දෙන්නේ නම් පමණි. ශුද්ධාත්මයාණන්ගෙන් පිරුණු වැඩිහිටියන් අත් තබා යාච්ඤා කිරීම තරුණ පරම්පරාව තුළ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය වර්ධනය වීමට ඉවහල් වේ. අද පළමු කියවීමේ අප දකින්නේ මෙවැනි සිද්ධියකි. ප්‍රසාද ස්නාපනය ලබා සිටි සමාරියයන් මත අපෝස්තුළුවරුන් අත් තබා යාච්ඤා කළ විට ඔවුන් තුළ ශුද්ධාත්ම ගින්න ඇවිළී ගියේය.

වැඩිහිටියන් අත් තබා යාච්ඤා කරන විට යම් කෙනෙකු තුළ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය වඩා ප්‍රබලව ප්‍රකාශ වීමට ඉඩ සැලසේ. **එවිට ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය පුද්ගලයාව සිත් හැරීමකට හා ජීවිත වෙනසකට යොමු කරයි. මෙතුවක් කල් නොතිබූ හෝ සැඟවී තිබූ ශුද්ධාත්ම දීමනා (අන්‍ය භාෂා වලින් කතා කිරීම, දිවැසි වැකි කීම, කථිකත්වය, සුව කිරීමේ බලය ....) මේ සමග ම ලැබීමද සුලභව දකින්නට ලැබේ. පිබිදීමේ ව්‍යාපාර තුළ ශුද්ධාත්මයාණන්ගේ බෞතීස්මය ලෙස අදහස් කරන්නේ ශුද්ධාත්මයාණන්ගේ මේ වඩා ප්‍රබල ප්‍රකාශ වීමයි.** ප්‍රසාද ස්නාපනය ලැබූ සෑම කිතුනුවෙකුගේ ම කැඳවීම මේ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය තමන් තුළ ඇතිකර ගැනීමයි.

පසුගිය සතියේ අප ක්‍රිස්තුන් වහන්සේව නොපෙනී යාම සහ එවන් අවස්ථාවක දී විශ්වාසය රැක ගැනීම ගැන කතා කළෙමු. අද සුවිශේෂයෙන් අප සවන් දෙන්නේ උන්වහන්සේ පසුගිය ඉරිදා පිලිප්ගේ පැනයට දුන් පිළිතුරේ ඉතිරි කොටසයි. උන්වහන්සේ ගෝලයින්ගෙන් වෙන්වන බව පවසන අතර ම ඔවුන් සමග සැමදා ජීවත් වන බවත් පවසන සේක. එනම් උන්වහන්සේ එක්තරා අන්දමකින් ඔවුන්ගෙන් සමුගන්නා අතර වෙනස් ආකාරයකින් ඔවුන් අතර සිටින සේක. කොහොමද එහෙම වෙන්නෙ? උන්වහන්සේ නැවත වැඩම කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ තුළිනි: "*උන්වහන්සේ ද (පියාණන් වහන්සේ) ඔබ සමග සදහට ම සිටින පිණිස වෙන සහායදායකයෙකු දෙන සේක.*" පළමු සහායදායකයා ක්‍රිස්තුන් වහන්සේ ය. උන්වහන්සේ

අපට සත්‍යය අනාවරණය කළ සේක. ඒ සත්‍යය කුමක්දැයි අපි පසුගිය සතියේ දැන ගතිමු. දෙවන සහායදායකයා නම් ක්‍රිස්තුන් වහන්සේ අනාවරණය කළ සත්‍යයේ ආත්මයයි.

**ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ වැඩ විසීම අපට වැදගත් වන්නේ ඇයි? උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය අප තුළ වර්ධනය කරගත යුත්තේ ඇයි? හේතුව ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ නොමැති විට අප ජීවත් වුණත් නොවුණා වාගේය. අප තුළ තෘප්තියක් නැත. සාමයක් නැත. නිදහසක් නැත.** අද ලෝකයට ළඟා වී ඇති විනාශය නම් මේ වෙනස අවබෝධ කර නොගැනීමයි. එමනිසා අපි සාමය, සතුට, නිදහස සොයමින් දුවමු. ජීවත් වෙනවා වෙනුවට මුළු ජීවිත කාලය ම ජීවත් වීමට උත්සහ කරමින් සිටිමු.

ශුද්ධාත්මයාණන් හිමිවන්නේ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි අදහන අයට පමණි. "*උන්වහන්සේ (ශුද්ධාත්මයාණන් වහන්සේ) පිළිගැනීමට ලෝකයා අපොහොසත් බව*" ක්‍රිස්තුන් වහන්සේ පැවසූ සේක. ඇයි ලෝකයාට උන්වහන්සේව පිළිගන්න බැරි? මෙහිදී ජුවාම් තුමා ලෝකයා යනුවෙන් අදහස් කරන්නේ දෙවියන් වහන්සේ සහ උන්වහන්සේට සම්බන්ධ සියලු දෙයට විරුද්ධව කටයුතු කරන අයයි. එවැනි අය ශුද්ධාත්මයාණන් හඳුනන්නේ නැත. චිත්‍රයක වටිනාකම හොඳින් දකින්නේ චිත්‍ර කලාව දන්න අයයි. ගීතයක් ගැඹුරින් රස විඳින්නේ සංගීතය දන්න අයයි. ඒ වගේ ශුද්ධාත්මයාණන් පිළිගැනීමට හැකියාව ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේව හඳුනන අයටයි.



ශුද්ධාත්මයාණන් වහන්සේව එවීමට පොරොන්දු වන අතර ක්‍රිස්තුන් වහන්සේ අපව අනාථ වීමට ඉඩ නොදෙන බවක් පවසන සේක. කොහොමද අපි අනාථ වෙන්නෙ? කාගෙන්වත් හව් හරණක් නැතිව ගියාම ඕනා කෙනෙක් අනාථ වෙනවා. ඒ වගේ තත්වයන් ගැන තමයි අපි ගිය සතියෙ කතා කළේ. ශුද්ධාත්මයාණන් අප තුළ සිටින තුරු අප අනාථ නොවෙමු. තනි නොවෙමු. අප මේ ලෝකයේ කිසිම කෙනෙකුගෙන් හෝ දෙයකින් පිහිටක් නැති වීමට ඉඩ ඇත. එහෙත් ආත්මික ලෝකයේ අපට සහායදායකයෙක් ඇත. ආත්මික ලෝකයේ ඇති බලයකින් භෞතික ලෝකයේ ප්‍රශ්නයකට උදව්වක් ලබා ගන්න පුළුවන්ද? ඇත්තෙන් ම ඔව්. අපේ මානසික තත්වයන් ශරීරයට බලපාන බව අපි පිළිගනිමු. එසේ නම් ආත්මික ලෝකයෙන් මනසට සහ ශරීරයට බලපෑමක් ඇති කිරීමට නොහැකිද? ආත්මයක් වන දෙවියන් වහන්සේ මනුෂ්‍ය ශරීරයක් තුළ මාංශගත වීමෙන් අපට පෙන්වා දෙන්නේ මේ හැකියාවයි.

තරුණ පරපුර ආගම දහමින් ඈත් වීම ගැන අපට අසන්නට ලැබේ. ගම් ප්‍රදේශ වල මේ තත්වය එතරම් දරුණු නොවුණත්, නාගරික ප්‍රදේශ සහ දියුණු යැයි කියන රටවල මේ දුරස් වීම ඛේදජනක මට්ටමකට ළඟා වී ඇත. **කෙනෙක් යමකින් ඈත් වන්නේ තවත් දෙයකට ළං වන නිසාය. ආගමින් ඈත් වන තරුණ පරම්පරාව ළං වන්නේ කුමකට ද? තාක්ෂණය, විද්‍යාව, තර්ක බුද්ධිය, ලිංගික නිදහස, මුදල් ඉපයීම .... මේ සමහරකි. දහමට වඩා මේවා තුළ ඇති ආකර්ශණය කුමක්ද?** තරුණ පරම්පරාව පමණක් නොව සෑම වයසක ම අය මේවාට ඇදී යෑමට හේතුව කුමක්ද? ජීවිතයේ අප සොයන දෙයක් මේවා තුළින් ලැබෙන නිසා විය නොහැකිද? ඇත්තට ම ඔව්. මේ හැම දෙයකින් ම අපට යමක් ලැබේ. සතුටක් ද, නිදහසක් ද, පහසුවක් ද, තෘප්තියක් ද .... හිමිවේ. නමුත් මෙලෙස හිමිවන සතුට, සාමය හා නිදහස කෙතරම් දුරට සාධාරණද? සාර්ථක ද? කල් පවතිනවාද? මේවා හොඳ විසඳුම් නම් අද වන විට ලෝකය පෙර තිබුණාට වඩා යහපත් අතට හැරෙමින් තිබිය යුතුය. එසේ නොවන බව අපි හොඳාකාරවම දනිමු. එසේ නම් වරදක් සිදුවී ඇත. සිදුවෙමින් පවතියි.

වරද නම් ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් සහ දීමනා වලින් පිරිපුන් පරපුරක් වෙනුවට දැනුමට, බුද්ධියට, තර්කයට, ශක්තියට සහ බලයට මුල් තැන දෙන පරම්පරාවක් බිහි වීමයි. මේ පරම්පරාවට සත්‍යය

වැටහෙන්නේ විනාශයක් සිදුවූවාට පසුවය. අශ්වයා පැන ගියාට පසු ඉස්තාලය වසා ඵලක් නැත.

අප සෑම කෙනෙක් ම එකිනෙකා මත ශුද්ධාත්ම බලය පතා යාච්ඤා කළ යුතුය. මුල් කිතුනු සභාව තුළ තිබූ කැපී පෙනෙන ලක්ෂණයක් නම් වැඩිහිටියන් විසින් අත් තබා යාච්ඤා කිරීමයි. (මෙහි වැඩිහිටියන් ලෙස හඳුන්වන්නේ වයසින් වැඩි අයම නොව ශුද්ධාත්මයාණන්ගෙන් පිරිපුන් අයයි.) අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දී රදගුරු තුමා මෙය සිදු කරයි. සුව මෙහෙයන් සහ යාච්ඤා මෙහෙයයන් හිදී ද පියතුමන්ලා මෙලෙස යාච්ඤා කරනු දක්නට ලැබේ. ඊට අමතරව, අපටත් එසේ යාච්ඤා කළ නොහැකිද? විශේෂයෙන් ම පවුල තුළ ඒ සඳහා විශාල ඉඩක් ඇත. **දෙමාපියෙනි, ඔබේ දරුවන්ට ශුද්ධාත්ම වරම් පතා ඔවුන් හිස මත අත් තබා යාච්ඤා කරන්න. ඔවුන්ට ආශිර්වාද කරන්න. ඔබේ ඥාති දූ දරුවන්ටත් එසේ කරන්න. එය පුරුද්දක් බවට පත් කරගන්න.**



**උපන් දිනයක දී, ජීවිතයේ අනෙක් විශේෂ අවස්ථා වල දී ඊට මුල් තැන දෙන්න. ඔබේ දරුවන් ලෝකය තුළ අනාථ වී යෑමට ඉඩ නොදෙන්න.**

ආගම දහමින් දුරස් වෙමින් යන ලෝකයක අතරමං නොවී ජීවත් වීමට නම් මේ පරම්පරාවට මෙන් ම ඊළඟ පරම්පරාවටත් ශුද්ධාත්ම මග පෙන්වීම අත්‍යාවශ්‍ය ය. අලුතින් ප්‍රසාද ස්නාපනය ලැබූ කිතුනුවන්ට අනුශාසනා කරමින් පේදුරු තුමා අද දෙවන කියවීමෙන් උපදෙස් දෙන්නේ ලෝකයා ඔවුන්ගේ විශ්වාසය ප්‍රශ්න කරන්නට මාන බලමින් සිටින නිසා ඊට මුහුණ දීමට සූදානම්ව සිටින ලෙසයි. ඒ සඳහා අවශ්‍ය වන්නේ තියුණු බුද්ධියක් හෝ දැනුමක් නොව ආචාරශීලි සහ ගෞරව සම්පන්න හැසිරීමක් වේ. එවන් යහපත් හැසිරීමක් අපට ලැබෙන්නේ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස මිස වෙන කොහෙන්ද?

***ශුද්ධාත්මෙනි ශුද්ධාත්මෙනි***
***ශුද්ධාත්මෙනි ශුද්ධාත්මෙනි***
***වස්වාලමින් ඔබේ වරම්***
***මා ජීවිතේ පුරවන් ඔබේ ආලෝකයෙන්***

***1. පිරිපුන් ප්‍රේමය තුළ වැඩ වසනා ශුද්ධාත්මෙනි***
***සත් වරමින් අප පොහොණි කරනු මැන ශුද්ධාත්මෙනි***
***ඔබ අභිමත අප සැලසුම් කළ මැන***
***ආලෝකය වී යනෙනා මග දිග***

***2. ජීවනයේ මග පහදා දෙනු මැන සමිඳුනි***
***වියවුල් බවිනුත් ගලවාලනු මැන සුරිඳුනි***
***නැණ නුවණින් ඔබ මග වටහා දී***
***ආලෝකය වී අප දිවි ගමනට***

*ගායනය: දයාන් විතාරණ*

*irudinasupuwatha@gmail.com*